**ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය- 2013**

**-----------------------------------------------**

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්ව විද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම වාර්තාව විශ්ව විද්‍යාල පනතේ 108(2) උප වගන්තිය ප්‍රකාර මාගේ විස්තරාත්මක වාර්තාව ලෙසද සැලකිය යුතුය.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ.තෝරාගත් පරිපාටින්, වංචා

හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.
මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රීලංරාඅගිප්‍ර)

--------------------------------------------------------

සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද නමුත් සමාලෝචිත වර්ෂය තුළ අඛණ්ඩව භාවිතා කරන ලද මුළු පිරිවැය රු.6,229,384 ක් වූ රසායනාගාර හා ඉගැන්වීමේ උපකරණ වැනි ස්ථාවර වත්කම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත-3 ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) විශ්ව විද්‍යාලය විසින් 2011 වර්ෂයේදී සබරගමුව විශ්ව විද්‍යාලයෙන් භාර ගන්නා ලද ලී බඩු වටිනාකම නිශ්චය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) "විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ එම්/එස් කොන්සෝටියම් නෝර්විජියන් විශ්ව විද්‍යාලය (NTNU) සම්බන්ධ ව්‍යාපෘතිය "හා "උප කුලපති අරමුදල" නමින් ගිණුම් දෙකක් විශ්ව විද්‍යාලය විසින් පවත්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට පිළිවෙලින් රු.1,743,603 ක් හා රු.2,912,411 ක් එම ගිණුම්වල පැවතුණි. කෙසේ වුවද එම ශේෂ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) මුළු වටිනාකම රු.19,411,037 ක් වූ ලී බඩු, උපකරණ, පොත් හා වාහන වැනි වත්කම් දිස්ත්‍රික්කයේ 1990 වර්ෂයේ පැවති යුධ වාතාවරණයේදී නැතිවී තිබුණි. මේ සම්බන්ධයෙන් රු.17,860,814 ක මුදලක් පමණක් නැති වූ වත්කම් ලෙස ගිණුම් පොත්වල ගලපා තිබුණි. කෙසේ වුවද රු.1,550,223 ක් වූ ඉතිරි වත්කම් සම්බන්ධයෙන් ගැලපීම් කර නොතිබුණි.

(ඈ) උපාධි අපේක්ෂක අධ්‍යාපනයේ අදාළත්වය හා ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීමේ (IRQUE) ව්‍යාපෘතිය 2011 වර්ෂයේදී නිම කිරීමෙන් පසුව, පරිගණක, ලී බඩු, පොත් හා

උපකරණ වැනි එම ව්‍යාපෘතියේ වත්කම් විශ්ව විද්‍යාලයට භාරදී තිබුණි. කෙසේ වුවද එම වත්කම් අගය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

### 2.2.3 ලැබිය යුතු ගිණුම්

------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය හා වෙනත් සේවා ස්ථානවලට මාරු කරන ලද නිලධාරීන් 253 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.10,175,390 ක් වූ ණය ශේෂයන් අයකර ගැනීමට විශ්ව විද්‍යාලය විසින් වර්ෂ 5 කට වැඩි කාලයක් කටයුතු කර නොතිබුණි.

(ආ) විදේශ සැපයුම්කරුවන්ට ලබාදුන් එකතුව රු.5,000,378 ක් වූ අත්තිකාරම් ඒ පිළිබඳ විමර්ශනය කිරීමට හා එම ශේෂ අදාළ සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව වර්ෂ 10 කට වැඩි කාලයක් ආනයන අත්තිකාරම් ගිණුම් 135 ක පැවතුණි.

(ඇ) වර්ෂ 01 සිට වර්ෂ 17 දක්වා කාලයක් පැවතුණු ඉන්ධන මිලදී ගැනීම් හා සම්මන්ත්‍රණ වැනි විවිධ කාර්යයන් සඳහා ගෙවන ලද එකතුව රු.මිලියන 14.61 ක් වූ අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) අදාළ සැපයුම්කරුවන් හඳුනා ගැනීමට හා ඔවුන්ගෙන් අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව විවිධ සැපයුම්කරුවන්ට ගෙවන ලද එකතුව රු.මිලියන 59.2 ක් වූ අත්තිකාරම් නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------

පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| | විෂයය | වටිනාකම | ලබාගත නොහැකි වූ සාක්ෂි |
|---|---|---|---|
| | --------- | ------------- | ------------------------- |
| | | රු. | රු. |
| (අ) | ඉඩම් හා ගොඩනැගිලි | 19,834,078 | හිමිකම් ඔප්පු |
| (ආ) | පිරියත හා යන්ත්‍රෝපකරණ | 4,337,313 | ස්ථාවර වත්කම් ලේඛන |
| (ඇ) | මෝටර් වාහන | 972,960 | ස්ථාවර වත්කම් ලේඛන |
| (ඈ) | ක්‍රීඩා භාණ්ඩ | 6,021,870 | ස්ථාවර වත්කම් ලේඛන |
| (ඉ) | ලී බඩු, සවිකිරීම් හා කාර්යාල උපකරණ | 132,868,565 | ස්ථාවර වත්කම් ලේඛන |
| (ඊ) | රසායනාගාර හා ඉගැන්වීමේ උපකරණ | 20,791,555 | ස්ථාවර වත්කම් ලේඛන |
| (උ) | පොත් හා වාර සඟරා | 17,889,686 | ස්ථාවර වත්කම් ලේඛන |
| (ඌ) | වෙනත් වත්කම් | 24,638,430 | ස්ථාවර වත්කම් ලේඛන |
| (එ) | විවිධ ණයගැතියෝ | 14,357,980 | විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ |

**2.2.5 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

**---------------------------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 1998 මාර්තු 06 දිනැති අංක පීඊ/01/174/11 (ආ) දරන ලිපිය හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2013 මැයි 23 දිනැති අංක 08/2013 දරන ආයතන චක්‍රලේඛ ලිපිය අනුව, රජයේ නිලධාරීන් සඳහා ගෙවිය යුතු භාෂා ප්‍රවීණතා දීමනාව, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරීන්ට ගෙවිය යුතු නොවේ. කෙසේ වුවද අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 10 දෙනෙකුට 2005 සිට 2011 මාර්තු දක්වා රු.321,110 ක මුදලක් ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ තවත් රු.187,252 ක මුදලක් අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 74 දෙනෙකුට භාෂා ප්‍රවීණතා දීමනාව ලෙස ගෙවා තිබුණි.

(ආ) විශ්ව විද්‍යාල පාලක සභාවේ හා සනාථන සභාවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ හෙද උපාධි වැඩ සටහනට පහසුකම් සැලසීම සඳහා

නෝර්වේ "ට්‍රොම්සෝ " විශ්ව විද්‍යාලයෙන් රු.17,327,951 ක් වූ අරමුදල් ලැබී තිබුණි. මේ සම්බන්ධයෙන් වෙනම ගිණුම් පොත් පවත්වා නොතිබුණි. නෝර්වේ විශ්ව විද්‍යාලයෙන් රු.17,327,951 ක් වූ මුදලක් ලැබී තිබුණද, හිටපු නියෝජ්‍ය මුල්‍යාධිකාරිගේ ප්‍රකාශයට අනුව මෙයින් රු.8,614,737 ක මුදලක් 2014 අප්‍රේල් 30 දක්වා වැයකර නොතිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තිරණවලට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 109 වගන්තිය | 2012 වර්ෂය සඳහා විගණිත මුල්‍ය ප්‍රකාශන හා විගණකාධිපති වාර්තාව 2014 අප්‍රේල් 30 දක්වා රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර නොතිබුණි. |
| **(ආ)** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය | |
| (i) X පරිච්ඡේදයේ 20.6 වගන්තිය | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දෙදෙනෙකු විසින් ලබාගත් වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර පොදු ආකෘති 96 මඟින් මාසිකව විගණකාධිපතිවරයාට වාර්තා කර නොතිබුණි. |
| XXVII පරිච්ඡේදයේ 3.1 වගන්තිය | විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම ලේඛනයක සටහන් කර නොතිබුණි. සම්ප්‍රදායක් වශයෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් පැමිණීමේ ලේඛනයක පැමිණීම සටහන් නොකරන බව මේ |

| | | |
|---|---|---|
| | | සම්බන්ධයෙන් උප කුලපති විසින් මා වෙත දන්වා තිබුණි. |
| (ඇ) | 2011 මැයි 06 දිනැති අංක පීඑෆ්/එෆ්එස්/ඒ/ වාහන /2011 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2013 ජූලි මාසයේදී විශ්ව විද්‍යාලයේ වාහන විකිණීමෙන් ලැබුණු රු.577,000 ක මුදල ඒකාබද්ධ අරමුදලට බැරකර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

-------------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ විශ්ව විද්‍යාලයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රු.621,470,000 ක රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.765,406,686 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ රු. 516,211,000 ක රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු.600,358,590 ක ඌනතාවයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.165,048,096 ක තවදුරටත් පිරිහීමක් පෙන්නුම් කෙරුණි. රු.9,133,842 කින් වෙනත් ආදායම වැඩිවීමට ප්‍රතිරූපව මෙහෙයුම් වියදම් රු.168,614,358 කින් වැඩිවීම එම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**4.1 කාර්ය සාධනය**

-------------------

සමාලෝචිත වර්ෂය තුළ විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කාර්ය සාධනය පහත පරිදි වේ.

**(අ) විභාග ප්‍රතිඵල**

-----------------

2013 වර්ෂයේදී පවත්වන ලද අවසන් විභාග හා සමත්වූ උපාධිධාරීන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| විස්තරය | කෘෂිකර්ම පීඨය | කලා හා සංස්කෘතික පීඨය | වාණිජ හා කළමනාකරණ පීඨය | විද්‍යා පීඨය | සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය |
|---|---|---|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී අවසාන විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 24 | 311 | 103 | 41 | 42 |
| විභාග සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව | 24 | 311 | 81 | 34 | 42 |
| උපාධි විභාග සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව විභාග සඳහා පෙනීසිටි ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස | 100% | 100% | 78.64% | 82.92% | 100% |

**(ආ) ශිෂ්‍යයින් බඳවා ගැනීම**

පසුගිය වර්ෂ 03 තුළදී එක් එක් පීඨය සඳහා බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව හා උපාධි ලබාගත් පසුව පිටවූ ශිෂ්‍ය සංඛ්‍යාව පහත දැක්වේ.

| පීඨය | බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව | | | උපාධිය ලබාගැනීමෙන් පසු පිටවූ ශිෂ්‍ය සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2010 | 2011 | 2012 |
| කෘෂිකර්ම පීඨය | 127 | 175 | 174 | 16 | 29 | - |
| කලා හා සංස්කෘති පීඨය | 1466 | 1621 | 1441 | 40 | 312 | 431 |
| වාණිජ හා කළමනාකරණ පීඨය | 771 | 911 | 869 | 56 | 118 | 28 |
| විද්‍යා පීඨය | 214 | 367 | 368 | 12 | 31 | 17 |
| සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය | 215 | 238 | 238 | - | - | 27 |
| එකතුව | 2793 | 3312 | 3090 | 124 | 490 | 503 |

2012 වර්ෂයේදී කෘෂිකර්ම පීඨයෙන් කිසිඳු ශිෂ්‍යයෙක් උපාධි ලබානොගත් අතර 2010 වර්ෂයේදී කලා හා සංස්කෘති පීඨයෙන් ශිෂ්‍යයින් 40 ක් පමණක් සමත්වී තිබුණි.

**(ඇ) ඒක ශිෂ්‍ය පිරිවැය**

**------------------**

විශ්ව විද්‍යාලයේ එක් එක් පීඨයේ මුළු පිරිවැය හා සමාලෝචිත වර්ෂය සඳහා ඒක ශිෂ්‍ය පිරිවැය පහත දැක්වේ.

| | කෘෂිකර්ම පීඨය | කලා හා සංස්කෘති පීඨය | වාණිජ හා කළමනාකරණ පීඨය | විද්‍යා පීඨය | සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය |
|---|---|---|---|---|---|
| මුළු පිරිවැය (රු) | 124,721,710 | 128,483,284 | 124,959,683 | 124,372,918 | 125,258,078 |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 255 | 1,290 | 775 | 579 | 359 |
| ඒක ශිෂ්‍ය පිරිවැය (රු) | 489,105 | 99,599 | 161,238 | 214,806 | 348,908 |

ඉහළම ඒක ශිෂ්‍ය පිරිවැය වූ රු.489,105 ක් වාර්තා වූයේ කෘෂිකර්ම පීඨයෙන් වූ අතර අඩුම ඒක ශිෂ්‍ය පිරිවැය වූ රු.99,599 කලා හා සංස්කෘති පීඨයෙන් වාර්තා විය.

**(ඈ) මහපොළ හා ශිෂ්‍යාධාර**

**------------------------**

සමාලෝචිත වර්ෂය තුළදී ශිෂ්‍යයින් 925 දෙනෙකුට මහපොළ ශිෂ්‍යත්ව ලෙස රු.16,689,950 ක් ගෙවා තිබූ අතර ශිෂ්‍යයින් 1,069 දෙනෙකුට රු.18,796,100 ක් ශිෂ්‍යාධාර ලෙස ගෙවා තිබුණි. කෙසේ වුවද ශිෂ්‍යයින් 610 ක් ඔවුන්ගේ පාඨමාලා අත්හැරීම හේතුවෙන් මහපොළ ශිෂ්‍යත්වවලට අදාළ රු.1,826,000 ක මුදලක් 2014 මැයි 22 දින විගණන දිනය දක්වා ගෙවා නොතිබුණි.

**(ඉ) පුස්තකාල පරිපාලනය**

**-----------------------**

පුස්තකාලයෙන් පොත් ලබාගත් කථිකාචාර්යවරුන් 52 ක් විසින් පොත් 393 ක් නියමිත කාලපරිච්ඡේදය තුළ පුස්තකාලයට ආපසු ලබාදී නොතිබුණි. වර්ෂ 01 සිට වර්ෂ 05 දක්වා කාලයක් හිඟව පැවති මෙම පොත් ආපසු ලබාගැනීමට හෝ ප්‍රමාදයන් සඳහා දඩ මුදල් අයකර ගැනීමට හෝ විධිමත් පියවරක් මේ සම්බන්ධයෙන් ගෙන නොතිබුණි.

**4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**-------------------------------**

උපකුලපති තනතුර සඳහා සුදුසුකම් ලත් පුද්ගලයන්ගෙන් විශ්ව විද්‍යාලය විසින් 2011 අගෝස්තු 25 දින ඉල්ලුම්පත් කැඳවා තිබුණි. 2006 මැයි 01 දින තම තනතුර හැර ගිය ගණිතය පිළිබඳ හිටපු 11 ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු උපකුලපතිවරයා ලෙස 2012 පෙබරවාරි 13 සිට බලපැවැත්වෙන පරිදි පත්කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උපකුලපති තනතුර සඳහා ඉල්ලුම්පත්‍ර 2011 සැප්තැම්බර් 30 දක්වා භාරගෙන තිබුණි. කෙසේ වුවද කැනඩා පුරවැසියකු වන නැගෙනහිර විශ්ව විද්‍යාලයේ ගණිතය පිළිබඳ හිටපු 11 ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයා, 2011 නොවැම්බර් 30 දක්වා සේවය හැර ගොස් සිටි අතරතුර උපකුලපති තනතුර සඳහා ඉල්ලුම්පත්‍රයක් එවා තිබුණි.

(ආ) උපකුලපති තනතුර සඳහා ඉල්ලුම්පත්‍රය 11 ශ්‍රේණියේ හිටපු කථිකාචාර්ය විසින් 2011 සැප්තැම්බර් 19 දින එවා තිබුණද, ඔහු නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා විශ්ව විද්‍යාලයට ඉල්ලීමක් කර තිබුණේ 2011 ඔක්තෝබර් 11 දින, උප කුලපති තනතුර සඳහා ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කිරීමෙන් පසුවය.

(ඇ) පාලක සභාව විසින් 2012 ජනවාරි 14 දින පවත්වන ලද එහි 220 වැනි රැස්වීමේදී ශ්‍රී ලංකා රජයේ ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 8.2 වගන්තියේ විධිවිධාන පිළිබඳ සැලකීමෙන් තොරව, 2006 මැයි 01 සිට 2011 නොවැම්බර් 30 දක්වා සේවය හැර ගොස් සිටි

කැනඩාවේ ජීවත්වන කැනඩා පුරවැසියකු උපකුලපති තනතුර සඳහා පත්කිරීම නිර්දේශ කර තිබුණි.

(ඇ) හිටපු 11 ශ්‍රේණියේ ජොෂ්ඨ කථිකාචාර්යවරයා 2012 පෙබරවාරි 13 දින උපකුලපතිවරයා ලෙස පත්කර තිබුණි. කෙසේ වුවද කැනඩාවෙන් ආපසු පැමිණ 2012 මාර්තු 05 දින විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා ලෙස ඔහු වැඩ භාරගෙන, එම දින සිට ගණිත දෙපාර්තමේන්තුවේ ගණිතය පිළිබඳ 11 ශ්‍රේණියේ ජොෂ්ඨ කථිකාචාර්යවරයා ලෙසද වැඩ භාරගෙන තිබුණි.

(ඉ) උප කුලපති ලෙස පත් කරන අවස්ථාවේදී කැනඩාවේ පදිංචිවී සිටියද මඩකලපුවේ ලිපිනයකට ඔහුගේ පත්වීම් ලිපිය තැපැල් කර තිබුණි.

(ඊ) 2011 ඔක්තෝබර් 11 දින හිටපු ජොෂ්ඨ කථිකාචාර්යවරයා විසින් ඉල්ලීමක් කිරීමෙන් පසු 2011 දෙසැම්බර් 01 දින විශ්ව විද්‍යාලය විසින් ඔහු යළි සේවයේ පිහිටුවා තිබුණද, ගණිතය පිළිබඳ 11 ශ්‍රේණියේ ජොෂ්ඨ කථිකාචාර්යවරයා ලෙස යළි වැඩ භාරගෙන තිබුණේ 2012 මාර්තු 05 දිනදීය.

## 4.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශිෂ්‍යත්ව මත විදේශගතවූ විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරුන් 59 ක් ශිෂ්‍යත්ව සම්පූර්ණ කිරීමෙන් පසුව විශ්ව විද්‍යාලයේ රාජකාරි සඳහා වාර්තා නොකර හෝ විශ්ව විද්‍යාලයෙන් ඉවත්ව ගොස් තිබුණි. කෙසේ වුවද ගිවිසුම් කඩ කිරීම් සම්බන්ධයෙන් මෙම කථිකාචාර්යවරුන් 59 ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු.150,994,569 ක් වූ මුදල් අයකර ගැනීමට විශ්ව විද්‍යාලය කටයුතු කර නොතිබුණි. බැඳුම්කර පැහැර හැරී 74 ගෙන් 12 දෙනෙකු සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදුකිරීමට හා ඔවුන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුවට භාරදී ඇති බව උපකුලපතිවරයා මේ සම්බන්ධයෙන් මා වෙත දන්වා තිබුණි. ජොෂ්ඨ රජයේ නීතිඥවරුන් දෙදෙනෙකු මේ සම්බන්ධයෙන් කටයුතු කරයි. තවද 2014 අප්‍රේල් 30 දක්වා බැඳුම්කර පැහැර හැරී කථිකාචාර්යවරුන්ගෙන් එකතුව රු.මිලියන 9.7 ක මුදලක් අයකර ගෙන තිබුණි.

(ආ) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 29 (ඇ) හා 29(ඉ) වගන්තිය ප්‍රකාරව පශ්චාත් - උපාධි ප්‍රදානය කිරීම සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය 2013 දෙසැම්බර් 31 වන විටත් ලබාගෙන නොතිබුණි. කෙසේ වුවද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව පශ්චාත් උපාධි පාඨමාලා (taught courses ) 3 ක් පවත්වා තිබුණි. දර්ශනපති (M-Phil) හා දර්ශන විශාරද (Ph.D) වැනි පර්යේෂණ පදනම් කරගත් පාඨමාලා සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය අවශ්‍ය නොවන බව මේ සම්බන්ධයෙන් උපකුලපතිවරයා මා වෙත දන්වා තිබුණි.

(ඇ) නිල නිවාස 20 ක සමාලෝචිත වර්ෂය අවසානයට පදිංචි වී සිටි නිලධාරීන් 38 දෙනෙකුගෙන් ශ්‍රී ලංකා රජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5 වගන්තිය ප්‍රකාරව නිවාස කුලී අයකර ගෙන නොතිබුණි. මේ අතර 2002 අප්‍රේල් 16 දිනැති අංක 147/2002 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 1 ඡේදය ප්‍රකාරව රජයේ තක්සේරුකරුගෙන් වාර්තාවක් ලබාගැනීමෙන් තොරව රු.150 සිට රු.600 දක්වා වූ මාසික කුලියට විශ්ව විද්‍යාලයට අයත් නිල නිවාසවල පදංචි නිලධාරීන්ගෙන් ආර්ථික කුලියක් අයකර තිබුණි.

## 4.4 වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය

-----------------------------------

සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ (FHCS) භාවිතය සඳහා පෙර වර්ෂය තුළදී වටිනාකම රු.මිලියන 13.36 කට වෛද්‍ය උපකරණ ඉන්දියාවේ පුද්ගලික සමාගමකින් ප්‍රසම්පාදනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුවක් (TEC) පත්කර නොතිබුණි. ඒ වෙනුවට, වෛද්‍ය උපකරණ මිලදී ගැනීම ප්‍රසම්පාදන කමිටුව (PC) විසින් නිර්දේශ කර අනුමත කර තිබුණි.

(ආ) සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය විසින් අවශ්‍ය ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව තෝරාගත් සැපයුම්කරුවන්ගෙන් විද්‍යුත් තැපැල (E-mail) මඟින් සෘජුවම මිල කැඳවීම් සිදුකර තිබුණි.

(ආ) විගණනයට ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව, මිල කැඳවුම් තුනම එකම සැපයුම්කරු විසින් ඉදිරිපත් කර තිබූ අතර සැපයුම්කරු විසින් එවන ලද මිල කැඳවුම්වල අක්‍රමිකතා තිබුණි. කෙසේ වුවද මෙය ප්‍රසම්පාදන කමිටුව විසින් සලකා බලානොතිබුණි.

(ඇ) " පටක සකස් කිරීම පිළිබඳ උපාංග අටක් " (eight accessories of the tissue processor ) නම් වූ වෛද්‍ය උපකරණය රු.මිලියන 4.5 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කර තිබුණද පටක සකස් කිරීම් උපකරණයේ රු.මිලියන 2.9 ක් වටිනා ප්‍රධාන කොටස මිලදී ගැනීමට නොහැකිවීම හේතුවෙන් එය මිලදී ගත් දින සිටම ඇසුරුම් පෙට්ටියක් තුළ නිෂ්කාර්යව පැවතුණි.

(ඉ) ව්‍යාජ මිල කැඳවුම් ඉදිරිපත් කිරීම, ඉතා ඉහළ මිළ ගණන් ඉදිරිපත් කිරීම, විශ්ව විද්‍යාලයට සපයන ලද විෂයයන්හි වර්ගය හා ලේබලය වෙනස් කිරීම, එසේම සැපයුම් ප්‍රමාද කිරීම මඟින් විශ්ව විද්‍යාලය නොමඟ යවා තිබුණු බැවින්, එම සැපයුම්කරු අසාධුලේඛනගත කිරීමට 2014 ජනවාරි 27 දින පැවැත්වූ විගණන කමිටුව විසින් නිර්දේශ කර තිබුණද, එම සැපයුම්කරු අසාධු ලේඛනගත කිරීමට විශ්ව විද්‍යාලය විසින් 2014 ජුනි 30 දක්වා කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් විශ්ව විද්‍යාලය විසින් පත්කරන ලද විමර්ශන කමිටුව විසින් නිර්දේශ කරන ලද පරිදි සැපයුම්කරුට ගෙවන ලද රු.850,546 ක වැඩිපුර ගෙවීම අයකර ගැනීමට විශ්ව විද්‍යාලය කටයුතු කර නොතිබුණි.

**4.5 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

2013 දෙසැම්බර් 31 දිනට විශ්ව විද්‍යාලයේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යා තත්ත්වය පහත දැක්වේ.

| **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** | **අතිරික්තය** |
|---|---|---|---|---|
| අධ්‍යයන | 230 | 153 | 72 | - |
| අධ්‍යයන සහාය | 14 | 09 | 05 | - |
| පරිපාලන | 29 | 19 | 10 | - |
| තාවකාලික ( අධ්‍යයන) | 59 | 58 | 01 | - |
| බාහිර | - | - | - | 70 |
| එකතුව | 332 | 239 | 88 | 70 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුරප්පාඩු 88 ක් පිරවීම සඳහා විශ්ව විද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය අවසාන විටත් පියවර ගෙන නොතිබුණි.

(ආ) විශ්ව විද්‍යාලයේ පීඨ 5 ක මහාචාර්ය හා සහාය මහාචාර්ය තනතුරු වැනි ප්‍රධාන අධ්‍යයන තනතුරුවල පුරප්පාඩු 20 ක් පැවතුණි. කෙසේ වුවද එම පුරප්පාඩු පිරවීම සඳහා විශ්ව විද්‍යාලය කටයුතු කර නොතිබුණි.

අවස්ථා රාශියකදී පුවත්පත් දැන්වීම් මඟින් පුරප්පාඩු තනතුරු ප්‍රසිද්ධ කරන ලද බවත් එහෙත් කිසිඳු ප්‍රතිචාරයක් නොවූ බවත් මේ සම්බන්ධයෙන් උප කුලපති විසින් මා වෙත දන්වා තිබුණි.

## 4.6 වත්කම් කළමනාකරණය

2007 වර්ෂයේදී රු.2,018,963 ක පිරිවැයකට මිලදී ගත් හා සනාථන ගොඩනැඟිල්ලේ සවිකරන ලද සෝපානයක් (Elevator) අමතර කොටස් නොමැතිවීම හේතුවෙන් වර්ෂ හයකට වැඩි කාලයක් උපයෝජනය කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**5.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2011 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව 2014 ජනවාරි 20 දින පාර්ලිමේන්තුවේ සභාගත කර තිබූ අතර 2012 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව 2014 අප්‍රේල් 30 දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛ ලිපිය අනුව, විශ්ව විද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළියෙල කර නොතිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

කාර්යක්ෂම හා ඵලදායී ආකාරයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශයට ස්ථිර හා පළපුරුදු කාර්ය මණ්ඩලයක් පත් කර නොතිබුණි.

**5.4 ප්‍රසම්පාදන සැලැස්ම**

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.5 අයවැය ලේඛනමය පාලනය**

අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරික්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරික්ෂණය විය.

**6. පද්ධති හා පාලන**

විගණනයේදී නිරික්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු උපකුලපතිගේ අවධානයට වරින්වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) අත්තිකාරම් ගෙවීම් හා නිරවුල් කිරීම

(ඈ) ප්‍රසම්පාදන පරිපාටිය

(ඉ) බඳවා ගැනීම් පරිපාටිය